# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2447/21 – 2025 ජූලි මස 29 වැනි අඟහරුවාදා – 2025.07.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39(අ)(1) වැනි වගන්තිය යටතේ නියමය

2005 මැයි මස 10 වැනි දින අංක 1392/6 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2005 අංක 44 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද 39 අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: L/03J/93/LRB/12.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: 3/2/5/5/2024-3542-73.

2025 ජූලි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර/ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම් පත්තුව සුළු කොට්ඨාසයේ,රාගම ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම 3542 හා 2006.08.22 දිනැති මූලික පිඹුරේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අංක 73 – කැබැල්ලගහ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.4619**

උතුරට: මූ.පි.ගම්. 3542 හි කැබලි අංක 26 සහ සී/ස පීලික්ස් පෙරේරා සහ සමාගම හිමිකම් කියන පොල්පිටිකුඹුර; නැගෙනහිරට:මූ.පි.ගම්. 3542 හි කැබලි අංක 12; දකුණට: මූ.පි. ගම්. 3542 හි කැබලි අංක 12 සහ මෙම පිඹුරේ කැබලි අංක 74 ; බටහිරට: මෙම පිඹුරේ කැබලි අංක 74, මූ.පි.ගම්. 3542 හි කැබලි අංක 26, මූ.පි.ගම්. 3542 හි 25, සී/ස පීලික්ස් පෙරේරා සහ සමාගම හිමිකම් කියන පොල්පිටිකුඹුර .

EOG 07– 0349



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 පෙබරවාරි මස 07 වැනි දින අංක 1796/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 39 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම්
සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/16.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය:
WGSWD&EIP/ACQ/KB/04.

2025 ජුලි මස 24 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර/ ඉඩම් මහ ලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535D, දිවුල්පිටිය නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දිවුල්පිටිය (කොට්ඨාස අංක 2 - දිවුලපිටිය, බොරලැස්ගමුව මහ නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/DSO/2023/330 හා 2024.07.24 දිනැති අනුරේඛනයෙහි සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම් වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්තවූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – වරිපනම් අංක 83 පරණ කැස්බෑව පාර – ප්‍රමාණය: හෙක්. 0.0073**

උතුරට: අඹගහවත්ත පාර සහ ආර්.එල්.ගීගනගේ හිමිකම් කියන පරණ කැස්බෑව පාරේ වරිපනම් අංක 83 දරන ඉඩම; නැගෙනහිරට: ආර්.එල්.ගීගනගේ හිමිකම් කියන පරණ කැස්බෑව පාරේ වරිපනම් අංක 83 දරන ඉඩම සහ සුජිත් ශ්‍රීනාත් ද සිල්වා හිමිකම් කියන පරණ කැස්බෑව පාරේ වරිපනම් අංක 81 දරන ඉඩම ; දකුණට: මු.පි. 9568 හි කැබලි අංක 100 සහ මෙම පිඹුරේ කැබලි අක්ෂර B; බටහිරට:කැබලි අක්ෂර B.

EOG 07 – 0350